

මොහුගේ එකම අභිලාෂය වූයේ දේවගැතිවරයකු වීමය. ඒ සඳහා ඔහු දේවගැති අභ්‍යාස විද්‍යාලයකට බැඳී ටික කලක් ඉගෙනීම ලැබුවේය. අවුරුදු පහළොව පමණ වනතුරු ඔහු එහි ඉගෙනීම ලැබුවේය. පසුව එය අතහැර දැමූ ඔහු කලක් නීතිය හැදෑරීය. ටිකකලක් නීතිය හැදෑරූ පසු එයද අතහැර දමා අවසාන වශයෙන් වෛද්‍ය විද්‍යාව හැදෑරීමෙහි නිරත විය. "මනුෂ්‍ය ශරීරයට ග්‍රහලෝකයන්ගේ බලපෑම" යන සිරස්තලය උඩ ඔහු විසින් ලියැවුණු නිබන්ධයකට වයස අවුරුදු තිස්දෙකේදී ඔහුට වෛද්‍යාචාර්ය උපාධිය ලැබිණ.

# බෙහෙත් නැතිව රෝග සුව කළ පුදුම දෙස්තර

**වත්මන්හි ඉමහත් දියුණුවක් ලබා ඇති වෛද්‍ය විද්‍යාව, තාරක විද්‍යාව, රසායන විද්‍යාව වැනි විද්‍යාවන් සැමෙකක්ම වාගේ විකාශනය වූයේ මිනිසා නොදියුණු යුගයේ බැසගත් මිථ්‍යා නිගමනයන් ආශ්‍රයෙනි. එසේම වන්නේ යුරෝපයේ ඇමෙරිකාව, එංගලන්තය, ජර්මනිය වැනි රටවල පොදුජන හිතසුව සලකා වැදගත් විද්‍යාවක් බවට පත්ව ඇති සමාධිකරණ විද්‍යාවද (ඔප්නෙටිසම්) විකාශනය වූවත් මුල් යුගයේ පැවති මිථ්‍යා විශ්වාසයන් වල පිටුවහලෙනි.**

සමාධිකරණ විද්‍යාවේ ඉතිහාසය අවුරුදු දහස් ගණනක් ඈතට දිවයත්තට පැරණි මිසර සභ්‍යත්වය සමයේ දී පවා මේ විද්‍යාවේ මූල සිද්ධාන්ත ගැන මිනිසුන් දැන සිටි බවට සාක්ෂි ඇත. එහෙත් නූතන යුරෝපයේ ජනතාව අතර මේ සම්බන්ධයෙන් උනන්දුවෙන් හා සැලකිල්ලක් ඇතිවන්නට වූයේ මේ මෑතක සිටය. එනම් දහඅට වන සියවසේ පමණ සිටය. එවැනි උනන්දුවක් ඇතිවීමේ ලා විශේෂයෙන්ම එක් පුද්ගලයකුගේ ක්‍රියාමාර්ගය වැදගත් ලෙස හේතුවිය. එම ශ්‍රේෂ්ඨ පුද්ගලයා නම් වෛද්‍යාචාර්ය ප්‍රන්ස් ඇන්ටන් මෙස්රේය. මොහු කොතෙක් මේ විද්‍යාව කෙසේ බලපෑවේද කියතොත් එය "මෙස්මරිසම්" යන නමින් පවා හැඳින්වෙන්නට විය.

ඔස්ත්‍රියන් ජාතිකයකු වූ මෙස්මර් උපන්නේ ක්‍රි.ව.1733 දී ඔස්ත්‍රියාවේ රයින් ගඟ අසබඩ වූ "ස්ටයින්" නම් ගම් පියසේය. මුලදී මොහුගේ එකම අභිලාෂය වූයේ දේවගැතිවරයකු වීමය. ඒ සඳහා ඔහු දේවගැති අභ්‍යාස විද්‍යාලයකට බැඳී ටික කලක් ඉගෙනීම ලැබුවේය. අවුරුදු පහළොව පමණ වනතුරු ඔහු එහි ඉගෙනීම ලැබුවේය. පසුව එය අතහැර දැමූ ඔහු කලක් නීතිය හැදෑරීය. ටිකකලක් නීතිය හැදෑරූ පසු එයද අතහැර දමා අවසාන වශයෙන් වෛද්‍ය විද්‍යාව හැදෑරීමෙහි නිරත විය. "මනුෂ්‍ය ශරීරයට ග්‍රහලෝකයන්ගේ බලපෑම" යන සිරස්තලය උඩ ඔහු විසින් ලියැවුණු නිබන්ධයකට වයස අවුරුදු තිස්දෙකේදී ඔහුට වෛද්‍යාචාර්ය උපාධිය ලැබිණ.

"ජීවමය කාන්දම් ශක්තිය" සම්බන්ධයෙන් ඔහුගේ අදහස් ප්‍රථම වරට අනාවරණය කළේ මේ ග්‍රන්ථයෙනි. එම මතය අනුව අහසේ තිබෙන ග්‍රහලෝකයන් හා පෘථිවියත් එහි ජීවීන් අතරත් අන්‍යොන්‍ය ප්‍රතික්‍රියාකාරීත්වයක් පවතියි. ග්‍රහලෝකයන් පෘථිවිය හා එහි ජීවීන් කෙරෙහි එක්තරා බලපෑමක් දක්වයි. එම ග්‍රහලෝක වලසිට මුළු විශ්වය පුරාම පැතිරී විසිරෙන එක්තරා අදෘශමාන ද්‍රව විශේෂයකිනි. මේ අදෘශ්‍යමාන ද්‍රව්‍යයන් සතුව ඒවායේ ශක්තිය හීන නොවී ශරීර ගස කොළ, ආදි සෑම ජීව අජීව වස්තුවක්ම විනිවිද ඇතුල්විය හැකි ශක්තියක් ඇති බැව් පර්යේෂකයන්ගෙන් ඔප්පු වන්නේ යැයි මෙස්මර් පැවසීය. එම ද්‍රව්‍ය විශේෂයට වෙනත් මාධ්‍යයක ප්‍රචාරය නැතිව සැතපුම් ලක්ෂ කෝටි ගණනක දුරක් වුවත් විහිදී පැතිර ක්‍රියාකාරී වීමට හැකිය. හිරු එළිය දර්ශන තලයටත් එක්කොට එහි බලය දෙගුණ තෙගුණ කොට තවත් වස්තුවක් කරා යොමුකළ හැකිවාක්

මෙන් මේ ග්‍රහලෝකයන්ගෙන් ශක්ති විශේෂයද එක්තැන් කොට තවත් පුද්ගලයකු හෝ වස්තුවක් කරා යවන හැකියි මෙස්මර් විශ්වාස කෙළේය. එම ශක්ති විශේෂය එක්තැන් කළ හැකි කාන්දම් ශක්තියක් මිනිස් සිරුරෙහි ඇතැයි ඔහු කීවේය.

## ග්‍රහලෝක වල ජීවමය ශක්තිය

ග්‍රහලෝක වලින් විහිදෙතැයි කියූ ඒ ජීවමය කාන්දම් බලය එක්තරා වායුවන් හෙවත් ද්‍රව්‍යයක් ලෙස ඔහු සැලකුවේය. එම ද්‍රව්‍ය මිනිසාගේ චිත්ත ශක්තියෙන් එක්තැන්කොට බලවේගයක් වශයෙන් තව පුද්ගලයකු කරා යවත හැකියැයි ඔහු විශ්වාස කළේය. මෙස්මරීය නිද්‍රාවට පත්වූ පුද්ගලයාට සමහර විටෙක මෙස්මරිකයා ගේ අත්වලින් සහ දෑස් වලින් එම ජීවමය ද්‍රව්‍ය විහිදෙන අයුරු පෙනුණු බැව් කියති. සමහරෙකුට එය පෙනෙන බැව් මෙස්මරිකයෝ පවසති.

මෙස්මර් තම සිද්ධාන්තයන් අනුසාරයෙන් ස්නායු රෝග සම්බන්ධව විශ්මය ජනක ප්‍රතිඵල ලැබීය. රෝග නිවාරණය සම්බන්ධයෙන් අද්භූත බලයක් ඇත්තකු ලෙස ඔහුගේ නම ප්‍රසිද්ධ විය. එහෙත් මෙස්මර්ගේ රෝග නිවාරණ ක්‍රමය වෛද්‍ය විද්‍යාවේ සම්මතයනට පටහැනි එකක් විය. ඔහුගේ වෛද්‍ය වෘත්තියටද එනිසා පහර වැදෙන්නට විය. එහෙත් අඛණ්ඩව ඔහු තම පර්යේෂණ කරගෙන ගියේය. සුප්‍රසිද්ධ වෛද්‍යවරුන් විසින් පවා සුව නොකළ හැකියැයි නිගමනය වුණු රෝගීන් පවා මෙස්මර් විසින් සුව කැරුණු හෙයින් අනින් වෛද්‍යවරුන් ගේ ඊර්ෂ්‍යාවටද ඔහු ලක්විය. අවසාන වශයෙන් විශේෂඥ වෛද්‍යවරුන් පවා සුව නොකළ හැකියැයි අතැර දමනු ලැබූ අන්ධ ගැහැනු දැරියක සුව කිරීම මොහු භාරගත්ට සූදනම් වෙත්ම වියානා වෛද්‍ය සංගමය විසින් ඔහු මිථ්‍යාවාදී පුද්ගලයෙකුයි ප්‍රසිද්ධ කොට වියනාවෙන් පිටුවහල් කෙරිණ. වියනාවෙන් පිටවූ මෙස්මර් ප්‍රංශයේ අගනුවර වූ පැරිසියට ගියේය.

පැරිසියට යනවිට ඔහුගේ වයස අවුරුදු හතළිස් දෙකකි. පැරිසියේ පදිංචියේ මූලාරම්භයේ සිටම ඔහු තම වෘත්තියෙන් සැලකිය යුතු ජයග්‍රහණයක් ලැබීය. ප්‍රංශ වැසියන් අතර ඔහුට ඉමහත් ජනප්‍රියත්වයක් ලැබිණ. මෙස්මර් විසින් තම රෝගයෙන් සුවකැරුණු බැව් පැරිස්හි ස්ත්‍රී පුරුෂයන් එකිනෙකා සමග පැවසුයේ ආරූඪ කර ගත් ගර්වයකිනි. මෙස්මර් ලවා රෝග සුව කරවා ගැන්මට යාම එක්තරා "මෝස්තරයක්" බවට පත්විය.

> **මෙස්මර් තම සිද්ධාන්තයන් අනුසාරයෙන් ස්නායු රෝග සම්බන්ධව විශ්මය ජනක ප්‍රතිඵල ලැබීය. රෝග නිවාරණය සම්බන්ධයෙන් අද්භූත බලයක් ඇත්තකු ලෙස ඔහුගේ නම ප්‍රසිද්ධ විය. එහෙත් මෙස්මර්ගේ රෝග නිවාරණ ක්‍රමය වෛද්‍ය විද්‍යාවේ සම්මතයනට පටහැනි එකක් විය. ඔහුගේ වෛද්‍ය වෘත්තියටද එනිසා පහර වැදෙන්නට විය.**

ඔහු කරා දිනපතා ඇදී එන රෝගීන් සංඛ්‍යාව අධික වීමෙන් පෞද්ගලික ප්‍රතිකාර කිරීම අපහසු විය. එනිසා ඔහු සාමූහික ප්‍රතිකාර ක්‍රමය යොදගත්තේය. සාමූහික ප්‍රතිකාරය සඳහා ඔහු යොදගත් චිකිත්සාගාරයද විශේෂ ස්වභාවයක් ඉසිලීය. රෝගීන්ට ප්‍රතිකාර කළේ විශාල ශාලාවකය. ජනෙල් ආදිය තිසා තිල්තිර වලින් ආවරණය කර තිබීමෙන් එම ශාලාව අඳුරු කර තිබුණි. එම ශාලාව මධ්‍යයේ "බැංක්" නමින් හැඳින්වුණු අඩියක් පමණ උස පියන රහිත විශාල රවුම් ටැංකියක් විය. එය වටා රෝගීන් තිහකට පමණ වාඩිගත හැකිවිය. එය ජලයෙන් පුරවා තිබුණි. එහි ඇතුළත යකඩ පතුරු වීදුරු කටු සහ කිහිප ප්‍රමාණයක බෝතල් ආදිය එක්තරා පිළිවෙලකට අතුරා තිබුණි. ටැංකියේ ගැටිය වටා සාදා තිබුණු සිදුරු තුළින් පිටතට නෙරා සිටිනසේ සවිකැරුණු යකඩ පොලු තම සිරුරේ වේදනාකාර ප්‍රදේශයන්හි ස්පර්ශ කරමින් වේදනා නාශක ජීවමය කාන්දම් බලය තම සිරුරට ඇතුල් කරගත්හ. මේ අතර මුළු ශාලාවේම දැඩි නිහඬතාවයක් ඉසිලීය. නිශ්චලතාවය බිඳෙන්නේ නොපෙනෙන ස්ථානයක සිට සංගීත කණ්ඩායමක් විසින් වැයෙන ඉමිහිරි තූර්ය නාදයෙන් පමණි.

විශාල ශාලාවේ නිහඬත්වය මඳ අඳුර, සිහින් සංගීතරාවය යන මේවායින් රෝගීන් තුළ එක්තරා ලීලාවක මානසික පසුබිමක් නිර්මාණය වෙයි. එම අවස්ථාව බලා මෙස්මර් ද රන්කමින් රිදීකමින් වැඩ දමූ වෛර්ණ සාටකයක් ඇඳගෙන මහේශාක්‍ය විලාසයකින් තේජස පතුරුවමින් ශාලාවට ඇතුල් වෙයි. ඔහු එක් එක් රෝගියා කරා ගමන් කරයි. තම යුගැස රෝගියාගේ මුහුණ මත මොහොතක් රඳවාගෙන සිටියි. ඒ අතර තම දෑත රෝගියා දෙසට දිගුකොට ඇඟිලි විහිද දෙඅත්ල රෝගියාගේ සිරුරේ ස්පර්ශ වන නොවන ආකාරයට සමීප කොට ඉහළ පහළ ගමන් කරවයි. ඊට පසු ඔහු වෙත ඇති කෙටි යෂ්ටියෙන් රෝගියා ස්පර්ශ කරයි. මේ අතර වචන කීපයක්ද ගැඹුරු ස්වරයකින් ප්‍රකාශ කරයි. මෙස්මර්ගේ මේ රෝග නිවාරණ ක්‍රමයෙන් රෝගීන් ලැබූ ප්‍රතිඵල පුදුම සහගතය.

එක් රෝගියෙක් මෙස්මරීය ප්‍රතිකාරයෙන් තමා ලත් අත්දැකීම් විස්තර කරන්නේ මෙසේය. මම සතර අවුරුද්දක් මුළුල්ලේම නොයෙකුත් වෙදුන්ගෙන් ප්‍රතිකාර ගත්තමුත් කිසිදු සිවයක් නොලදිමි. අවසානයේ දී මම මෙස්මර් වෙත යාමට තීරණය කළෙමි. නිතර හිස වෙව්ලීමත් බෙල්ල ඉදිරියට නමා වැටීමත් ඇස්වල දැවිල්ලත් ඒවා ඉදිරියට නෙරා තිබීමත් මගේ රෝගයේ සමහර ලක්ෂණයන්ය. මගේ පිට කොන්ද සම්පූර්ණයෙන්ම අප්‍රානිකව තිබුණි. මා කතා කළේ පවා මහත් අසීරුතාවයකිනි. කිසිදු හේතුවක් නැතිව මට ඉබේටම සිතහයාමද සිදුවිය. එහෙත් මෙස්මර්ගේ ප්‍රතිකාර ක්‍රමවලින් මා ලැබූ සුවය ආශ්චර්ය ජනකය. ඔහු මට ප්‍රතිකාර කරන විට අත් පාවලින් අයිස් පිටවෙන්නාක් මෙන් දැනුනි. මගේ ශරීරයට තද උණුසුමක් දැනෙන්නටද දහඩිය දමන්නටද විය.

පැරිසියට පැමිණ අවුරුදු හයකට පමණ පසු මෙස්මර් සහ ඔහුගේ ගෝලයන් අතර ආරවුලක් ඇතිවිය. ඔහුගේ ප්‍රතිකාර ක්‍රමයේ මේ භේදයට හේතුවූයේ රහස් ආවරණය කොට ප්‍රසිද්ධ කථා පැවැත්වීමට යයි ගෝලයන් කළ ඉල්ලීමය. මේ අරගලයට මැදිහත් වූ ප්‍රංශ රජය මෙස්මර්ගේ සිද්ධාන්තයන්ගෙන් ඇත්ත නැත්ත සොයාගැනීම සඳහා කොමිසමක් පත් කළේය. කොමිසම තම වාර්තා සකස් කිරීම සඳහා පරීක්ෂණ කීපයක්ම කළේය. එම රපෝර්තුවෙන් කොටසක් මෙසේය.

කොමසාරිස් වරුන්ගේ විශේෂ සැලකිල්ල යොමු වූ එක් වැදගත් කරුණක් ඇත. එනම් අප පර්යේෂණයට භාජනය වූ පුද්ගලයන් මෙස්මරීය කරණයට භාජනය කැරෙන බැව් නොදැන සිටි විට මෙස්මරීය කරණයේ දී සිදුවෙතැයි සැලකෙන "අයිස් පිටවීම" වැනි උත්කර්ෂණයන් ඔවුන් කෙරේ ඇති නොවීමය. උදහරණයක් වශයෙන් ජුමෙලින් විසින් කැරුණු පරීක්ෂණය ගත හැක. මොහු විසින් "මෙස්මරයින්" ස්ත්‍රීයකට ඔහුගේ අත ඇගේ සිරුරට සමීප වනවිටම රස්නයක් දැනුණු බැව් කීවාය. පසුව ඇගේ දෑස බැඳ ඇයව මෙස්මරයිස් කරන බව දැන්වීමෙන් එවිට ඈ ඉහත කී ලෙසම රස්නයක් දැනෙන බැව් කීවාය. එහෙත් එම තරුණියට කලින් දැනුම් නොදී මෙස්මරයිස් කළ විට කිසිදු අමුත්තක් නොදැනුණ බැව් කීවාය. මෙසේ කීපදෙනෙක්ම ඔවුන් මෙස්මරීය කරණයට භාජන නොකර සිටියදීත් අමුතු ගතියක් දැනුණු බැව් කී අතර ඇත්ත වශයෙන්ම මෙස්මරීය තරණය කළ විටදී කිසිදු වෙනසක් නොදැනුණු බැව් කීහ.

මෙයින් ඔප්පු වන්නේ පරීක්ෂණයට භාජනය වන්නාගේ සංකල්පනයෙන්ම උත්කර්ෂණයන් ඇතිවන බවත් සංකල්පනය නැති තැන උත්කර්ෂණයන් ඇති නොවන බවත්ය.

ඒ සමගම ඔවුහු කාන්දම් බලයක් හෝ ද්‍රවයක් යයි කිවහැකි කිසිත් නැති බවත්, එනිසාම කාන්දම් බලයකින් රෝග නිවාරණය වීමක්

සිදුවෙතැයි යන්න පිළිගත නොහැකි බවත් ඒකමතිකව තීරණය කළහ. ඒ සමගම රාජකීය වෛද්‍ය සංගමයද මෙස්මර්ගේ ජීවමය කාන්දම් ශක්තිය පිළිබඳ සිද්ධාන්තය වැරදි බැව් පළකර සිටියහ. මේ හැම නිගමනයකින්ම පහර වැදුනේ මෙස්මර්ගේ වෘත්තියටය. ඊට ටික කලකට පසු ඔහු ප්‍රංශය අතහැර යළිත් ඕස්ත්‍රියාවට ගියේය. ජාත්‍යන්තර කීර්තියක් ලැබූ මෙස්මර් අවසාන කාලයේදී අප්‍රසිද්ධියේ දිවි ගෙවා ක්‍රි.ව.1815 දී ජන්මාන්තර ගතවිය.

මෙස්මර් හා ඔහුගේ ක්‍රමය සම්බන්ධව ඉහත කරුණු කෙටි විස්තරයෙන් මෙස්මරීය ක්‍රමයක් සමාධිකරණයක් අතර ඇති සම්බන්ධය පසක් කිරීමේ දී පහසුවක් ඇතිවෙයි.මේ මෝහන හාස්කම කළේ ජර්මන් විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයකු විසින් ශිෂ්‍යාව මොහ්නයකට පත්කළ මහාචාර්ය වරයා පසුව අවශේෂ කොටස බලා සිටි වෛද්‍ය ශිෂ්‍යයන්ට භාර දුන්නේය. වෛද්‍ය ශිෂ්‍යයෙක් ඇගේ ඇඳුම් ගැලවීමට අණ කළේය. එහෙත් ඇය එය ඉටු නොකළාය. මීට කරුණු කිහිපයක් හේතුවිය. පළමුවැන්න යටිහිත වශී කිරීමට ඔහු සමත් නොවීමය. මේ ගැන කරුණු දැක්වූ මහාචාර්ය වරයා ඇය මෝහනයේ සිටියදී ඇගේ ඇඳුම් ඇය ලවාම ගැලවීමටත් ඇය නිර්වස්ත්‍ර කිරීමටත් පහසුවෙන්ම පුළුවන් කමක් තිබුණ බව කියයි. එය ක්‍රමනුකූලව කළයුත්තකි.

මෝහනයේ දී බලහත්කාරයෙන් යමක් කළ නොහැකිය. ඇය වෛද්‍ය පරීක්ෂණයකට ලක්කළ යුතු නිසා ඇගේ ඇඳුම් ගැලවිය යුතු බව ඔහු කියයි. මෙවැනි උපක්‍රමයකින් තාත්වික නොවූ යම් අරමුණකට එය තාත්වික ලෙස ඒත්තු ගන්නා පරිදි එවැනිම ස්වරයෙන් ඇවිටිලි කළානම් මේ ශිෂ්‍යාවගේ යට ඇඳුම් පවා ඇය ලවාම ගැලවීමට ඉඩ තිබුණු බව ඔහු කියයි. එහෙත් යටිහිතේ බලවත් ලෙස සදාචාරය තහවුරු වූ යෞවනියක් මෝහන නිද්‍රවකදී වූවද යටිහිතට විරුද්ධව දුරාචාරයකට පෙළඹවිය නොහැකි බව ලෝකප්‍රසිද්ධ වශීකරුවකු වූ පීටර් කැසන් සඳහන් කරයි. යම් හෙයකින් උපක්‍රම ශීලීව සම්‍යක්ප්‍රයෝගී ඇවිටිලි ක්‍රමයකින් දුරාචාරය බලනොපාන ඉහත සඳහන් කළ යම්කිසි අරමුණකට ඇගේ අවධානය යොමුකළේ නම් ඉතා පහසුවෙන්ම ඇය නිරුවත් කිරීමට ඉඩ තිබුණ බව කැසන්ගේ මූලධර්මය අනුමත කරන මහාචාර්යවරයා කියයි.

> මෝහනයේ දී බලහත්කාරයෙන් යමක් කළ නොහැකිය. ඇය වෛද්‍ය පරීක්ෂණයකට ලක්කළ යුතු නිසා ඇගේ ඇඳුම් ගැලවිය යුතු බව ඔහු කියයි. මෙවැනි උපක්‍රමයකින් තාත්වික නොවූ යම් අරමුණකට එය තාත්වික ලෙස ඒත්තු ගන්නා පරිදි එවැනිම ස්වරයෙන් ඇවිටිලි කළානම් මේ ශිෂ්‍යාවගේ යට ඇඳුම් පවා ඇය ලවාම ගැලවීමට ඉඩ තිබුණු බව ඔහු කියයි. එහෙත් යටිහිතේ බලවත් ලෙස සදාචාරය තහවුරු වූ යෞවනියක් මෝහන නිද්‍රවකදී වූවද යටිහිතට විරුද්ධව දුරාචාරයකට පෙළඹවිය නොහැකි බව ලෝකප්‍රසිද්ධ වශීකරුවකු වූ පීටර් කැසන් සඳහන් කරයි.

## අවිශ්වාසයෙන් සනාථ කිරීම

මෝහනය විශ්වාස නොකළ එක් යුද නිලධාරියෙකුට මේ ලෝක ප්‍රකට වශීකරුවා යස පාඩමක් ඉගැන්වූයේය. දිනක් ඔහුගේ කැමැත්ත අනුව මහා සභාවක් ඉදිරියේ මෝහනයට පත් කරන ලදී. පැය භාගයක් පමණ තිත්දෙත් වශීකරුවා කී හැමදෙයක්ම කළ මේ නිලධාරියාට අවසානයේ දී සිදුවූයේ මහා ඇබැද්දියකි. ඔහු මෝහනයෙන් පිබිදෙන විට ඇඳ සිටි කලිසම අතේ ඇතිව සිටියේය. එවිට මොහු වටා කොක්හඬ තලමින් සිටි පිරිස අතර ඔහුගේ කාර්යාලයේ ටයිප් ගසන කෙල්ලන් රංචුවක් ද වූහ. පොළොව පලාගෙන යන තරම් ලජ්ජාවට පත්වූ මොහු එද සිට මෝහන විද්‍යාව මහපුදුම දෙයක් ලෙස විශ්වාස කළේය.

## මෝහනය කරන ආකාරය

මෝහනයක් සාර්ථක කිරීමට කරුණු කිහපයක්ම සම්පූර්ණ විය යුතුය.පළමුවෙන්ම මෝහන විද්‍යාඥයා මෝහන විද්‍යාව මනා ලෙස ප්‍රගුණ කළ කලබල නැති තැන්පත් කෙනෙකු විය යුතුය. තව කෙනෙකුගේ ඉන්ද්‍රයයන් පාලනය කිරීමට සැරසෙන ඔහු පළමුව තමන්ගේ සැලැස්ම ක්‍රමානුකූලව සිතා ඉන්ද්‍රියයන් පාලනය කිරීමට ශාන්ත ස්වරයෙන් ඒ තැනැත්තා හෝ තැනැත්තිය නිදි ගන්වයි.නැලවිල්ලකින් කුඩා දරුවකු නිදිකරන්නාක් මෙන් ඉතා මෘදු ඇවිටිලි ක්‍රමයකින් නින්දට පත්කිරීම මෝහන විද්‍යාඥයාගේ සිරිතයි. මේ සඳහා ක්‍රම කිහිපයක් ඉවහල් කර ගනියි. ඇතැම්මු ඇවිටිලි කරන අතර අතේ ඇඟිලි විහිදුවා මෝහනයට ලක් කළ තැනැත්තියගේ මුහුණට කිට්ටු කර ඇස් වලට නොගැටෙන පරිද්දෙන් එහාට මෙහාට කරති. එක් ඇවිටිලි ක්‍රමයක් මෙසේය. මෝහනයට භාජනය වන තැනැත්තා හෝ තැනැත්තියගේ මුහුණට කිට්ටු වූ වශී කරුවා "ඔව් දැන් නිදිමතයි නේද" හෙඳටම නිදිමතයි. හොඳයි නිදගන්න. ඔව් හොඳට ඇස් දෙක පියා ගෙන නිදගන්න. සුවසේ නිදගන්න. ඇඟට හොඳ සනීපයක් දැනෙනවා. හොඳට සුවසේ නිදගන්න. දැන් ඔබ තද නින්දේ ඇස් දෙක බරවෙලා.

මෝහනයට ලක් තැනැත්තිය වශීකරුවාගේ වසගයට වැටී හොඳටම නිද ගනී. ඊළඟට තමන්ගේ අණට කීකරු කරගන්නා ඔහු ඇවිටිලි මාර්ගයෙන් නිදි ලොවේදීම ඔහු රුචි කරන ඕනෑම අරමුණක් කරා ඇය ගෙන යයි.

බලපාන පරිසරය

මෝහනය සඳහා තෝරාගන්නා ස්ථානය තිහැඬියාව රජකරන ස්ථානයක් විය යුතුය. ශබ්දය පමණක් නොව කාමරයේ හෝ ශාලාවේ නොවෙයි. ඇසට ලක්වන කිසිවක කලබල ගතියක් නොතිබිය යුතුය. පිටස්තර ශබ්දවලින්ද ඈත්විය යුතුය. ඊළඟට ඇඳක් හෝ යම්කිසි දෙයක් මත වැතිරෙන්නට ඉඩහැර ඇවිටිලි හා ප්‍රශ්න උත්තර ක්‍රමයකින් ස්වකීය මෝහනය අරඹයි.

## ලෙඩ සුව කිරීම

නොයෙක් විට බේත් හේත් නාල්ලන හිනෙත් සැදුණු ඇගේ ලෙඩ රෝග මෝහන සමාධි නිද්‍රාවෙන් සුළු කලකදී සාර්ථකව සුවවේ. ශෛල්‍ය කර්මයනට භාජනය වූ රෝගීන් විඩාව වේදනාදිය සංසිඳවීමටත් අසාධ්‍ය රෝගීන්ටත් දුබලයන්ටත් මරණාසන්න රෝගීන්ගේ සිත් තැන්පත් කිරීමට අවසන් මොහොතට චිත්ත සුවය ඇති කිරීමට උගත් වෛද්‍ය විශේෂඥවරු මෝහන ප්‍රතිකර්මය අනුමත කරති. මේ සඳහා වෛද්‍යක්‍රම සිත ගත විවේකයට පත්කිරීම ස්වයං යෝජනාක්‍රම ස්වයං මෝහන විධි, බාහිරභාවිතා, මෝහන මාධ්‍යයන් මාධ්‍ය කොට ගනී.

දරු ප්‍රසූතියේ දී මාතාවන්ට මෝහනයෙන් විශාල පිටුවහලක් ලබාගත හැකි බව මෑතකදී සෝවියට් රුසියාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කළේය. ඒ අනුව දරු ප්‍රසූති අවස්ථාවේ දී මැණිවරුන්ට කිසිම වේදනාවක් බියක් භාතියක් නොමැතිව හොඳ සිහි නුවණින් යුතුවම එම කාර්ය සිදුකර ගැන්මට මෝහනය මහත් පිටුවහලක් සලසාලයි. අද බ්‍රිතාන්‍ය ඇමෙරිකාව හා ජර්මනිය වැනි රටවල මේ පිළිබඳව ප්‍රවීන වෛද්‍යවරුන් පොදු මහජනතාවට මෝහනයෙන් ජීවිතයේ වැදගත් අංශ වලදී යහපත සලසති. ඒ හැරුණු විට බැරෑරුම් ශෛල්‍ය කර්මයන්හිදී දත් ඉගිල්ලීම හා පිරවීමේදී ද බිඳුනු ඇට යළි සවි කරනු ලබන අවස්ථාවලදී වේදනා නාශක මාධ්‍යයක් වශයෙන් "මෝහනය" කැපී පෙනේ. දිගුකල් පවත්නා සමහර ඇදුම රෝගයකින් පෙලෙන්නෝ බොහෝවිට ස්නායු ගත දේෂයකින් පෙලෙන බවත් ඊට අදල සාර්ථක පිළියමක් ලෙස මෝහනය හැඳින්විය හැකි බවත් වෛද්‍යචාර්ය ඇස්.ජේ.වැන් පෙල්ට් මහතා පවසයි. මේ අනුව මනෝ ස්නායු රෝගාබාධවලින් පෙලෙන බොහෝ රෝගීන් මෝහනයෙන් නිට්ටාවට සුවය ලබයි.

දිගුකල් ශාරීරික මානසිකව පීඩා විඳි යම් යම් ආබාධ ඇති බොහෝ රෝගීන් සහ දුබලයින් වාර කිහිපයකින් මෝහනය උපයෝගී කොටගෙන සුවපත් කළ බැව් වෛද්‍ය විලියම් බ්‍රවුන් සඳහන් කරයි. සමහර අංශභාග රෝගීන් පවා ඔහු වෙතින් සුවපත් විය. අවුරුදු විසිතිස් හතළිස් ගණන් ගොළුවන් බිහිරන් ව සිටි පුද්ගලයින් සහ උපතින්ම ගොළුවන් බිහරන් ගොත ගසන්නන්ව සිටි රෝගීන් රැසක් මෝහනය මගින් වෛද්‍ය ජේම්ස් බ්රේඩ් විසින් සුව කරන ලදී. පිලිස්සීම් එක්ස්රේ කිරණ, රශ්මි චිකිත්සා,සැත්කම් ඖෂධ හා ආලේප වෛද්‍ය ප්‍රතිකාර යන හැම ආකාරයෙන්ම සුවයක් නොලත් දරුණු සමේ රෝගයකින් පෙළුණු රෝගීන් සම්බන්ධයෙන් මෝහනයෙන් ලද සාර්ථකප්‍රතිපල බටහිර වෛද්‍ය වාර්තාවල සඳහන් වේ. වෛද්‍යචාර්ය ලෙස්ලි ඕ තෝර්න් මනෝ විග්‍රහ චිකිත්සක ප්‍රතිහාරයෙන්ද සුවනොවී මෝහනයෙන් අවසානයේ විපුල ඵල ලැබූ එවැනි රෝගියෙක් පිළිබඳව වරක් විස්තර කළේය. බේත් හරි නොගිය අවසන් මෝහනයෙන් සාර්ථකව සුවකළ දිගුකාලීනව ලෙඩින් පෙළුණු "එග්සීමා" සහ තවත් නොයෙකුත් සම මතුපිට රෝග සුවකිරීම බටහිර වෛද්‍ය ලෝකයෙන් නොයෙක් විට අසන්නට ලැබේ.

ඇදුම,බඩේ දැවිල්ල, ලේ ගමනය, දරුණු රුධිර පීඩනය, හෘදයාබාධ,නෂ්ඨකාම බෙලහීනතා ස්ත්‍රීකාම උදාසීනතා ස්වප්න දෝෂ ලිංගික වෙනත් ආබාධ, හතිය සමහර යක්ෂ ප්‍රේත අංශභාග අජීර්ණ රෝගාබාධ මෝහනයෙන් බොහෝවිට සාර්ථක සුවයකට පත්කොට ඇත. මෝහනයට පත්වන රෝගියාගේ බාහිර අභ්‍යන්තර සියළුම ඉන්ද්‍රියයන් විවේචනයට පත් කළ හැකි වේ.

මිනිසාට වැළඳෙන රෝගාබාධයනට ඔහුගේ අතිශයින් අද්භූත ලෝකයකින් බඳු වූ "යටිසිත" බලපාන්නේ නම් මිනිසාගේ සෞඛ්‍ය පිළිබඳවද ලෙඩ සුවය පිළිබඳවද යටිසිතේ බලපෑම් අවශ්‍යය. මිනිස් සිතේ රෝග නිවාරණ ශක්තීන් මෝහනයෙන් ප්‍රබෝධ කළ හැක. හෘදය පෙනහළු,අක්මාව, ආමාශය,වකුගඩු,, රුධිර ධාවන ඉන්ද්‍රියයන් ආහාර දිරවීමේ ඉන්ද්‍රියයන්, මළ මූත්‍රා පහ කිරීමට සම්බන්ධ අවයව,ලිංගේන්ද්‍රියයන්ගේ නානා විධි ග්‍රන්ථීන් මිනිසාගේ යටි සිතින් ඉබේම පාලනය වන ඉන්ද්‍රිය පද්ධතියක් බව නූතන මනෝවිද්‍යාව හෙළි කරයි. මිනිසාගේ "මනස" ලිංගික ජීවිතයට තදින් බලපාන බව තව දුරටත් විශේෂඥයින්ගේ අලුත් මතකයට මේ අනුව මිනිසාගේ සෑම අංශයක් පිළිබඳව මෝහන ප්‍රතිකාරයේ දී සලකා බැලිය හැකි වේ. ඔහුගේ උඩුසිත තැන්පත් වීමෙන් මෝහන නිද්‍රාවේදි ඇගේ කිපී ඇති සෑම දෝෂයක්ම සංසිඳී යන්නට පටන් ගනී. "මෝහනය" මිනිසාට තමන්ගේ එදිනෙද ජීවිතයේ දී ද බොහෝ කටයුතු වලට සාර්ථකව යොදගත හැකි බව ආචාර්ය ඩෙස්මන්ඩ්රන් ලෙස්ලි කුන්, සැල්වටෝ රුසෝ, ප්‍රැන්සිස් ජේ.එඩිසන් සහ මනෝ විද්‍යාඥ ගිල්බට් ඕක්ලි යන අය පවසති. දුම්බීම, මත්පැන්පානය,නියපොතු කෑම, කුඩා ළමුන්ට නිදි යහනේ දී මූත්‍රා යෑම, ආදි අපහසුතාවන්ටත්, නොමනා පුරුදු ඇබ්බැහිකම් දුරුකර ගැනීමටත් තමන් විවිධාකාර අංශ වලදීත් මෝහන විද්‍යාව මිනිසාට ඉමහත් ප්‍රයෝජනවත් බව මෙල්වින් පවස් සහ විලියම් ඩවස්ඩි වැනි ආචාර්යවරුන් පවසති.

දැනට වසර දහස් ගණනාවකට පෙර සිටම මිසරය, බැබිලෝනියා, ඉන්දියාව ග්‍රීසිය වැනි රටවල විසූ මිනිසා මෝහන විද්‍යාවේ මූලධර්ම වටහාගෙන තිබූ බව පෙනේ. එහෙත් මෙය විද්‍යාවක් වශයෙන් යුරෝපයේ ස්ථාපිත වන්නට වූයේ දහ අටවන දහනමවන සියවස් වල පහළ වූ මෙස්මර් ජේම්ස් ඕරේඩ් වැනි වෛද්‍යවරුන්ගේ පර්යේෂණයන් නිසාය. එනෙක් මෙතෙක් මෝහන විද්‍යාව මනෝ විද්‍යාත්මක හා වෛද්‍ය විද්‍යාත්මක උපාංගයක් වශයෙන් විශාල දියුණුවකට පත්ව ඇත. ❑

**මාතර**
**සුමිත් වීරතුංග**